

# ඌරැවලිගේ වන්නියලැත්තන්ගේ විශ්වීය ප්‍රකාශය

2025 මිහිකත සමුළුව අති උත්කර්ශවත්ව සමරන අද දිනයේ ආදිවාසී මුතුන්මිත්තන් විසින් අප වෙත දායාද කරන ලද සොබාදහම් විශ්වකෝෂයෙන් බිඳක් ඔබ සමඟ බෙදා ගැනීමට ලැබීම පිළිබඳව මා ඉතාමත් සතුටට පත්වෙමි. මා අද මෙම පණිවුඩය ඔබ වෙත ගෙන ඒන්නේ හුදෙක් ආදිවාසී නායකයකු ලෙස නොව, මුළු මහත් විශ්ව තලයේම පවතින වනාන්තරවල, ගංගාවල,කඳු ශිඛර වල වෙසෙන සියළු ජීවීන්ගෙ හඬක් ලෙසිනි. ඔබත් මමත් දෙපයින් නැගී සිටින මිහිමව සුරැකීම උදෙසා මගේ ආදීවාසී මුතුන්මිත්තන් විසින් මාහට කියාදුන් දෑ අද මා මේ විශේෂ පණිවුඩය හරහා ඔබ වෙත ගෙන ඒන්නෙමි.

ප්‍රථමයෙන්ම, අප තේරුම් ගත යත්තේ අපත් ස්වාභාවධර්මයත් යනු දෙකක් නොව ඒකක් බවයි. ගසක් දිගේ ඇදී යන වැලක් මෙන් අපත් ස්වාභාවධර්මයත් ඒකිනෙකට සහ-සම්බන්ධව පවතී.අපගේ ප්‍රාණ වායුව ලබාදෙන්නේ මිහිතලයේ ඇති තුරු ලතාවන් වන අතර ශරීර පද්ධතිය ක්‍රියාත්මක වන්නේ මිහිකතින් ලැබෙන ආහාර සහ ජලයෙනි. ඒමෙන්ම අපගේ ප්‍රඥාව සහ සියලු ශක්‍යතාවයන් නිර්මාණය වන්නේ සූර්යයාගෙන් බලගැන්වුණු මහා විශ්ව ශක්තින්ගෙන් වේ. ඉදින් මිහිකත සමුළුව 2025 සමඟ සම්බන්ධ වන ඔබ අප සියලු දෙනා විසින් අවබෝධ කරගත යුතු සත්‍ය වන්නේ අපත් මේ සොබාදහමත් අතර ඇත්තේ ගැඹුරු ලේ නැකමක් බවයි. මේ ආකාරයෙන් සිතා බලන විට, වනාන්තර යනු පෘථිවි තලයේ පෙනහළු බවත්, පස පෝෂණය කරමින් ජීවීන්ට ආහාර නිෂ්පාදනය කරන දැවැන්ත කර්මාන්තශාලා බවත් හුදෙක් පෙනෙන හා නොපෙනෙන අසංඛ්‍යාත ජීවීන් ජීවත් කරවන්නට පොරබදි දැවැන්තයන් බවත් ඔබට පෙනී යනු ඇත.

ශාක ප්‍රජාව මෙන්ම සත්ත්ව ප්‍රජාවද මෙකී ලේ නැකම් වලට උරුමකම් කියයි. වන සතුන් යනු අපගේ විරුද්ධවාදීන් නොව, ඔබත් අපත් මෙන්ම ස්වභාවධර්මය සමතුලිතව පවත්වා ගැනීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන කණ්ඩායමකි. මඳක් නැවතී සිතා බැලුවහොත්, විටෙක ඔවුන් මිනිසාද අභිබවා යමින් පරිසරය රැක ගැනීමේ කාර්යභාරයේ නිරත වන්නේ නොවේද? සතුන් නොමැති කලෙක මිනිසා යනු කවුරුන්ද? සියලු ශාක සහ සතුන් නැතිවූ කල මිනිසාගේ ආත්මයට පැවැත්මක් තිබේ යයි ඔබ සිතනවාද?

මාගේ මූලික පණිවිඩය වන්නේ, මිහිතලය ආරක්ෂා කිරීමට අප ගන්නා සියලු උත්සාහයන් තුළ, මිනිසා මෙන්ම මිහිතලයේ එක්ව වාසය කරන සමාන උරුමකරුවන් සමඟ ගැටුම් ඇති නොවීමට වගබලා ගනිමින් අප කල්පනාකාරීව හා දූරදර්ශීව ක්‍රියා කළ යුතු බවයි. ඔබගේ නිවසේ ජීවත්වන්නට ඔබට අයිතියක්

ඇතිවා මෙන්ම, මිහිතලයේ ජීවත්වන්නට අලියාට, කොටියාට, මුවාට මෙන්ම ඇසට නොපෙනෙන කුඩා ක්ෂුද්‍ර ජීවියාටද අයිතියක් ඇත. වැට මායිම් එයට පිළිතුරක් නොවන අතර ඒ වෙනුවට අප ඔවුන්ගේ සීමාවන් අවබෝධ කර ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා වලට ගරු කරමින් සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කරගැනීමට තරම් බුද්ධිමත් විය යුතුය.

ජීවිතයේ එක්වරක් හෝ මේ පණිවුඩය කියවන ඔබ, එයින් පසුව තබන අඩියක් අඩියක් පාසා සොබාදහම දෙස මේතාක් බැලුවාට වඩා වෙනස් ලෙස සිතන්නට පටන් ගනු ඇතැයි මම විශ්වාස කරමි. සොබාදහම පිළිබඳව තීරණ ගැනීමට වෙනම පාලකයින් අවශ්‍ය නොවන්නේ, මිහිමත වාසය කරන සියල්ලෝම සොබාදහමේ සම භාරකරුවන් නිසාවෙනි. මේ කාර්ය සඳහා නීති රෙගුලාසි අදාළ වන්නේ නැත. අවශ්‍ය වන්නේ හර්දසාක්ෂිය පමණක්මය. ඔබ ගන්නා හුස්මට, බොන වතුර බිඳට, දෙපයින් නැගී සිටින පොලොවට සාධාරණයක් ඉටු කරන්නේ නම්, සියල්ල විසඳෙනු ඇත.

මෙතැන් පටන්, අප මහපොළොවේ වසන උසස්ම ජීවී ප්‍රභේදය ලෙස උදම් ඇනීම පසෙක තබා මහපොළොවේ භාරකරුවන් ලෙස මනුෂ්‍යත්වයෙන් නැඟී සිටින හැකි සහ සොබාදහම සමඟ සහජීවයෙන් ජීවත් විය හැකි අනාගතයක් අපේ දරුවන්ටත් ඔවුන්ගේ දරුවන්ටත් උරුම කර දෙමු. මිහිතලය අපගේ නොව, අප මිහිතලයට ආ සංචාරකයින් බව දැන වගකීමෙන් ඉදිරියට පිය නඟමු.

විශ්ව කීර්ති වනස්පති ඌරුවරිගේ වන්නියලැ ඇත්තෝ,

ශ්‍රී ලංකා ආදිවාසී නායක

2025 පෙබරවාරි මස 13 වන දින